# කම්මැලි මීයන්ගෙන් අපට පාඩමක්

සෝමලතා සුබසිංහ නාට්‍යවේදිනිය විසින් රචිත පුංචි අපට දැන් තේරෙයි නාට්‍ය ළමා සිත් ආකාර්ෂණය කරගත් නාට්‍යයකි. ළමා ලෝකයේ සුන්දරත්වය ඉස්මතු වන පරිදි සත්ව චරිත යොදාගෙන මෙම නාට්‍ය රචනා කර ඇත. නාට්‍ය ආරම්භයේ දී ම නාට්‍යයේ ප්‍රධාන චරිත හඳුන්වා දෙයි. කඩිසර කුකුළු හාමි කෙනෙක් හා කම්මැලි මී පැටවු හතර දෙනෙකු ප්‍රධාන කරගෙන නාට්‍යය ගලාගෙන යයි. ආරම්භයේ දී කුකුළු හාමීව මෙසේ හඳුන්වාදෙයි.

කුකුළු හාමී ඉතා කඩිසර, මහන්සි වී වෙලාවට වැඩ කරන, ගෙදර දොරේ කටයුතු වල යුහුසුලුව යෙදෙන චරිතයක් බව  නාට්‍ය ආරම්භයේදීම ගායක කණ්ඩායම හඳුන්වාදෙන අතර කුකුළු හාමී අභිරූපණයෙන් ඉදිරිපත් කරයි.

ඈත එපිට ගම්මානෙක - උදෙන් නැගිට

බස බස ගා තටු විහිදා - කුක්කු කූ කුක් කියලා

ඉර පායන ආරංචිය - නොවරදවා ගමට කියන

නියම වෙලාවට හඬලන - කුකුළෙක් හිටියා..........

මී හාමිලා හතරදෙනෙකි. මොවුන් ඉතා කම්මැලිකමෙන් යුතු, කැම නොමැති, ඉදුම් හිටුම් නොමැති කුඩා වයසේ අය වේ.

මී හාමිලා හතර දෙනයි - ඉන්ඩ තැනක් උන්ට නැතෙයි

කන්ඩ දෙයක් උන්ට නැතෙයි - බොන්ඩ දෙයක් උන්ට නැතෙයි.........

ඉතාම කම්මැලි මොවුන් තමාට ජීවත් වීමට නිවසක් හෝ සාදා නොගනී. ඒ එවිට නිදාගැනීමට අවශ්‍ය ඇඳ ඇතිරිලි කොට්ට මෙට්ට සෙවීමට කම්මැලි බැවිනි. මෙහි දී සෝමලතා සුබසිංහයන් මිනිසාගේ අරපිරිමැස්මේ ගුණය ද සිහිකරයි.

කම්මැලි මීයන්ට කුකුළු හාමී සිහිවීමෙන් කතාව ඉදිරියට ගලා යයි. කුකුළු හාමී සොයා ගොස් අනුකම්පාව දිනා ගැනීමට මීයන් තීරණය කරයි.

කුකුළු හාමී මේ මීයන්ට උදවු කිරීමට කැමති වේ.

කුකුළු හාමී : හුරුබුහුටියි මේ පැටවුන්

අහිංසකයි වගේ පෙනෙයි......

මී පැටවු හතර දෙනාම ඉතා දඟකාරය. පොතක පතක වැඩක්, හෝ ඇහැට පෙනෙන වැඩක්වත් නොකරයි.නිතරම සෙල්ලම් කරයි.

දිනක් වී කරලක් දකින කුකුළු හාමීට කැවුම් සෑදීමට සිතී මීයන්ගෙන් උදවු ඉල්ලයි. නමුත් කම්මැලි මී පැටවු වැඩ කිරීමට අකමැතිය. වැඩ නොකර සිටීමට කුකුළු හාමීට බොරු හේතු පවසයි.

1 වැනි මීයා : ගෙදර වැඩක් අල්ලා නෑ

ගණං හදාගෙන නොගියොත්

දෙවි පිහිටයි මට........

අවසානයේ කුකුළු හාමී තනිවම පිටි කොටා කැවුම් උයයි. කැවුම් සුවඳ දැනුනු පසු මී පැටවුන්ට කැවුම් කැමට ආසා හිතෙයි. කම්මැලි මී පැටවුන්ට පාඩමක් ඉගැන්වීමට කුකුළු හාමී අවස්ථාවක් කරගනී.

කුකුළු හාමී : කව්දැයි කව්දැයි කරල ගෙනාවේ

මී පැටවුන් : කුකුළු හාමී නොවැ කරල ගෙනාවේ

කුකුළු හාමී : කව්දැයි වී ටික කොටලා ගෙනාවේ

මී පැටවුන් : කුකුළු හාමී නොවැ කොටලා ගෙනාවේ.............

අවසානයේ මී පැටවුන්ට කම්මැලිව සිටීමේ වරද තෙරුම් යයි.ඔවුන්ට කැවුම් කෑමට අයිතියක් නැති බව මොවුන් තේරුම්ගනියි.

ළමා නාට්‍යයක් වුවද ලොකු කුඩා සියලු දෙනාටම මෙයින් ආදර්ශ ලැබේ. නාට්‍ය පුරාම කුකුළු හාමිගේ චරිතය ආදර්ශමත්ය.දරුවන්ට යහපත් දේ උගන්වන, ගුණ යහපත්, දැනුම් තේරුම් ඇති අයෙකි.

මී පැටවුන් හතර දෙනා දඟකාර තම්මැලි, කුඩා චරිත වේ.

නාට්‍ය අවසානයේ කම්මැලි මීයන්ට පාඩමක් උගන්වා ප්‍රේක්ෂකයාට ආදර්ශයක් සපයයි.

**පැවරුම : නාට්‍යයේ තේමාව දක්වන ගීතය පාඩම් කර ගායනා කරන්න.**